**<u>මධ්‍යම පළාත් සභාවේ සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන සේවා ගණයෙහි සමූපකාර සංවර්ධන නිලධාරී තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය සංශෝධන අංක - 01</u>**

| ඡේද අංකය | දැනට පවතින පෙළ | යෝජිත සංශෝධනය | සංශෝධනයට හේතුව |
|---|---|---|---|
| 15. අන්තර් කාලීන විධි විධාන | මෙම නව පරිපාටිය අනුව අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධාරීන්ගේ පෙර සිටි පංතියේ/ශ්‍රේණියේ සේවා කාලය අන්තර්ග්‍රහණය කරනු ලැබූ ශ්‍රේණියේ සේවා කාලය ලෙස සලකනු ලැබේ. | 15.1 මෙම නව බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුව අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධාරීන්ගේ පෙර සිටි පංතියේ/ශ්‍රේණියේ සේවා කාලය අන්තර්ග්‍රහණය කරනු ලැබූ ශ්‍රේණියේ සේවා කාලය ලෙස සලකනු ලැබේ.<br><br>15.2 මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ක්‍රියාත්මක වන 2014.06.04 දිනය වන විට,මෙයට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය යටතේ I පන්තියට උසස් වී වසර 05 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් වැටුප් වර්ධක 05 ක් උපයා ගෙන ඇති නිලධාරීන් මෙම බඳවා ගැනීමේ පරිපාටිය යටතේ I ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ. | 2014.06.04 දින අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුව I වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය වන විටත් පැරණි බඳවා ගැනීමේ පරිපාටිය යටතේ 1 වන පන්තියට උසස් වී වසර 05 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් වැටුප් වර්ධක 05 ක් උපයා ගෙන ඇති නිලධාරීන් පමණක් I ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම. |

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය -: නිර්දේශ කරමු.

01. පී.ජී. අමරකෝන් මහතා (සභාපති) ..........

02. ඩබ්ලිව්.එම්.එස්.ඩී. වීරකෝන් මහතා (සාමාජික) ..........

03. ඒ.එම්.ආර්.බී. තෙන්නකෝන් මහතා (සාමාජික) ..........

04. ඒ.එම්. වයිස් මහතා (සාමාජික) ..........

05. එච්.එම්.ඩී.ආර්. හේරත් මහතා (සාමාජික) ..........

06. ජේ.ඩී.කේ. වික්‍රමරත්න මහතා (සාමාජික) ..........

07. පී.ටී.ජී. ගුණතිලක මයා (සාමාජික) ..........

ගරු ආණ්ඩුකාරතුමා විසින් 2022-08-12 දින අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්